(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 389.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 සැප්තැම්බර් මස 09 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3243/'12

1.

ගරු රවි කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3689/'13

2.

ගරු අනුර දිසානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2012 වර්ෂය තුළ රැකියාවන් සඳහා විදේශගතවූ සමස්ත ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරිස පුහුණු, නුපුහුණු, අර්ධ පුහුණු මධ්‍යම මට්ටම, ලිපිකරු, ගෘහ සේවිකා හා වෙනත් යන වර්ගීකරණයන් යටතේ වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) විදේශගතවූ ඉහත පිරිසට අයත් කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත (ii) හි එක් එක් කාණ්ඩය යටතේ වූ කාන්තාවන් සංඛ්‍යාව, අදාළ වර්ෂයේ විදේශගත වූ සමස්ත කාන්තා ශ්‍රමිකයන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3738/'13

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3925/'13

4.

ගරු සුජීව සේනසිංහ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) විදේශ රැකියා ඒජන්සි ආයතන විශාල සංඛ්‍යාවක් මගින් වැඩි වැටුප් ලැබෙන නිශ්චිත රැකියා සඳහා යොමු කරන බව පවසමින් විදේශගත කරනු ලබන ශ්‍රමිකයින් විදේශයන්හිදී අඩු වැටුප් ලබන රැකියාවල යොදවනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාජ තොරතුරු සපයා ශ්‍රමිකයින් විදේශගත කරන රැකියා ඒජන්සිකරුවන්ට එරෙහිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගෙන ඇති නීතිමය පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4227/'13

5.

ගරු රන්ජන් රාමනායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2004 වර්ෂයේ සිට මේ දක්වා මහජන ඡන්දයෙන් තේරී පත්වූ ප්‍රාදේශීය සභා නියෝජිතයින්, නගර සභා නියෝජිතයින් සහ පළාත් සභා නියෝජිතයින් අතරින් මේ වන විට දූෂණ, අපරාධ හෝ වෙනත් නීති විරෝධී ක්‍රියා සිදුකිරීම හේතුවෙන් චෝදනා එල්ලවී ඇති සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, අයත් දේශපාලන පක්ෂ සහ ඔවුන් පළාත් සභාවේ, නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ දැරූ හෝ දැනට දරන තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් මහජන නියෝජිතයින් අතරින් මේ වන විට නීති මගින් කටයුතු කිරීම ආරම්භකර ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වන විට නීතිය ඉදිරියට පමුණුවා වරදකරුවන් වී, දඬුවම් ලැබූවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි දූෂිත පිරිස් පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජනය කිරීම සංවිධානාත්මක දූෂණ, අපරාධ හා නොයෙකුත් නීති විරෝධී ක්‍රියාකාරකම් තවදුරටත් සිදුවීමට හේතු වී ඇති බව පිළිගන්නේද;

(ii) නීති විරෝධී ක්‍රියාවන්හි යෙදෙන දූෂිතයන් හා අපරාධකරුවන් ප්‍රාදේශීය හා පළාත් සභා දේශපාලනයට පිවිසීම වැළැක්වීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4442/'13

6.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දැයට කිරුළ 2014 සංවර්ධන වැඩසටහන යටතේ කුලියාපිටිය කාර්මික විද්‍යාලයට ලබා දුන් පහසුකම් කවරේද;

(ii) එකී පහසුකම් ලබාදීම වෙනුවෙන් වැය කරන ලද ප්‍රතිපාදනවල වටිනාකම කොපමණද;

(iii) එම ප්‍රතිපාදන යටතේ සිදු කළ නවීකරණ කටයුතු සහ පහසුකම් ලබාදීමේ කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර අවසන් කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4560/'13

7.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මවුලවි ගුරුවරුන් 424 දෙනෙකු බඳවා ගැනීම පිණිස 2008.08.29 දින අංක 1565 දරන රජයේ ගැසට් නිවේදනය මගින් අයදුම්පත් කැඳවන ලද බවත්;

(ii) එම තරග විභාගය සමත් වූ පිරිස අතරින් 148 දෙනෙකුට 2010 වර්ෂයේදී පත්වීම් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී තරග විභාගයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණය ලබා ගෙන සම්මුඛ පරීක්ෂණයටද ඉදිරිපත් වූ අයදුම්කරුවන් 276 දෙනෙකුට මෙතෙක් මවුලවි ගුරු පත්වීම් ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම අයදුම්කරුවන්ටද නොපමාව මවුලව් ගුරු පත්වීම් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4568/'13

8.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් විසින් වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට උපයා දෙන මැද පෙරදිග රටවල් දහය කවරේද;

(ii) එම එක් එක් රටෙහි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සෑම රටකම ශ්‍රී ලංකා තානාපති කාර්යාල පිහිටා තිබේද;

(iv) එම එක් එක් තානාපති කාර්යාලයෙහි සේවය කරනු ලබන භාෂා පරිවර්තක නිලධාරීන් සහ කම්කරු නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම රටවල සේවය කරනු ලබන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සංඛ්‍යාවට සාපේක්ෂව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් තානාපති කාර්යාලවල සේවයේ යොදවා නොමැති බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් එම රටවලදී පොලිස් අත්අඩංගුවට පත්වුවහොත්, එම අවස්ථාවේදීම ඒ බව ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට දැනුම් දීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සකස් වී තිබේද;

(ii) ශ්‍රී ලංකාව සහ එම රටවල් අතර අවබෝධතා ගිවිසුම් ඇති කර එවැනි ක්‍රමවේදයක් සකසා ගැනීම තුළ නීතිමය ප්‍රශ්නවලට මුහුණ දෙන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට තානාපති කාර්යාලවල රැකවරණය ලබා ගැනීම සඳහා අවස්ථාව සැලසෙන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4586/'13

9.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) නොරොච්චෝලේ විදුලි බලාගාරයෙහි භාවිතා කිරීම පිණිස මෑතකදී ආනයනය කළ ගල් අඟුරු පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් අරඹා තිබේද;

(ii) ඉහත කී ආනයනයට සම්බන්ධ ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත කී කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් අරඹා ඇත්තේ මන්ද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී ගල් අඟුරු බහාලුමෙහි ආනයනකරුගේ නම කවරේද;

(ii) ඉහත කී ආනයනකරු තෝරාගත්තේ කෙසේද;

(iii) ආනයනකරුගෙන් අලාභය අය කර ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

(iv) ගල් අඟුරු ආනයනය සම්බන්ධයෙන් අනාගතයේදී එවැනි තත්ත්වයක් නැවත ඇතිවීම වළක්වා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4631/'13

10.
ගරු පී. හැරිසන් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගොවිසෙත ලොතරැයිය ආරම්භ කිරීමට මූලික කර ගත් කරුණු කවරේද;

(ii) එම ලොතරැයිය ආරම්භ කරනු ලැබූ වර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත අනුව ගොවි විශ්‍රාම වැටුපට දායක වූ ගොවි මහතෙකුට විශ්‍රාම වැටුප ලැබීමට තිබිය යුතු අවම සුදුසුකම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගොවිසෙත ලොතරැයිය ආරම්භයේ සිට මේ දක්වා එම ලොතරැයි අරමුදලින් ගොවි විශ්‍රාම වැටුපට බැර කර ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන්; සහ

(ii) මේ වන විට අවශ්‍ය වයස් සීමාව සම්පූර්ණ කිරීම මත ගොවි විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කර ඇති ගොවීන් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන්;

එතුමා සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4662/'13

11.
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේ ජනවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මත්පැන් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 වර්ෂයේ ජනවාරි සිට 2013 වර්ෂයේ සැප්තැම්බර් දක්වා කාල සීමාව වෙනුවෙන් මත්පැන් බලපත්‍ර නිකුත් කරන ලද සමාගම් වෙතින් රැස් කර ගන්නා ලද සුරා බදු ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මත්පැන් බලපත්‍ර නිකුත් කරනු ලදුව, 2012 සහ 2013 වර්ෂ වෙනුවෙන් සුරා බදු ගෙවීම් පැහැර හරින ලද කවර හෝ සමාගම් තිබේද;

(ii) එසේ නම්, එම ගෙවීම් පැහැර හරින ලද සමාගම්වල නම් කවරේද;

(iii) එකී එක් එක් සමාගමෙන් අයවිය යුතු මුළු සුරා බදු හිඟ මුදල කොපමණද;

(iv) ඉහත සඳහන් කරන ලද කවර හෝ සමාගමක මත්පැන් බලපත්‍ර සුරාබදු දෙපාර්තමේන්තුව විසින් අලුත් කරනු ලැබ තිබේද;

(v) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4743/'14

12\.
ගරු අශෝක් අබේසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලයට මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාණිජ බැංකුවලින් ණය මුදල් ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ලාබ හෝ පාඩු නොමැති මට්ටමින් ලංකා විදුලිබල මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4796/'14

13\.
ගරු අජිත් පී. පෙරේරා මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේදී විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය මඟින් ඉතාලියේ හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් යොමු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, යොමු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම පිරිස තෝරා ගත් පදනම කවරේද;

(ii) එම පිරිස තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ වෙනත් ප්‍රචාරණ විධි ක්‍රමයක් අනුගමනය කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4798/'14

14\.
ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරයේ විදුලි උත්පාදනය ආරම්භ කළ දින සිට මේ දක්වා එය අක්‍රිය වූ වාර ගණන සහ එක් එක් අවස්ථාවේදී අක්‍රියව තිබූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ දක්වා එය අක්‍රිය වූ අවස්ථාවන්හිදී එහි අලුත්වැඩියා කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(iii) එම අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය වූ මුදල බලාගාරය අක්‍රිය වූ එක් එක් අවස්ථාව අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අක්‍රියවීම් අදාළ උපකරණවල වගකීම් කාලය තුළ සිදු වූයේ නම්, ඉහත පරිදි මුදල් වැය කිරීමට හේතු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ සිදුවූ අක්‍රියවීම් හේතුවෙන් එම කාල සීමාවන් තුළ වෙනත් බලාගාර ඔස්සේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය එක් කිරීම සඳහා වැය කළ අතිරේක මුදල කොපමණද;

(ii) ඉහත තාප විදුලි බලාගාරයේ බිඳ වැටීම් හේතුවෙන් වැය වූ අතිරේක මුදල එකතු කළ විට විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා කොපමණ මුදලක් වැය වී තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ),— විදේශිකයන්ට, විදේශීය සමාගම්වලට සහ විදේශීය කොටස් හිමිකාරිත්වයක් ඇති ඇතැම් ආයතනවලට ශ්‍රී ලංකාවේ ඉඩම්වල සන්තකය පැවරීම සීමා කිරීමට විධිවිධාන සැලසීම සඳහා ද; නිදහස් කිරීම් ප්‍රදානය කර ඇති අවස්ථානුගත කරුණු නිශ්චිතව සඳහන් කිරීම සඳහා ද; විදේශිකයන්ට, විදේශීය සමාගම්වලට සහ විදේශීය කොටස් හිමිකාරිත්වයක් ඇති ඇතැම් ආයතනවලට ඉඩම් බද්දට දීම වෙනුවෙන් ඉඩම් බදුකරණ බද්දක් පැනවීම සඳහා ද; ඇතැම් සංවර්ධන ව්‍යාපෘති සඳහා සහන සැලසීම සඳහා ද; 1963 අංක 11 දරන මුදල් පනතේ VI වැනි කොටස ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජුලි 21 දිනැති අංක 1872/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.19 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

*2.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*4.

මහනගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*14.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*17.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,—2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 34 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 19 දිනැති අංක 1863/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*19.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*21.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*27.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*28.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*29.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*30.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*31.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

32.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.

ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

ජම් ඉය්යතුස් සහ්වා අල් - හයිරිය්යා (ජස්කා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

42.

අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

43.

අල්හසන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---